# ඉතිහාසයේ ප්‍රථමවරට ලංකාවේ සැමන් රට යවයි



**මෙරට** ඉතිහාසයේ ප්‍රථම වතාවට විදේශ වෙළඳපොළේ අලෙවි කිරීම සඳහා ටින් මාළු අපනයනය කරන අවස්ථාව ඉතිහාස ගතවන බව ධීවර, ජලජ හා සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මහතා පැවසීය.

පුත්තලම මදුරන්කුලිය Ocean food කර්මාන්ත ශාලාවේ නිෂ්පාදිත ocean star jack macrkerel ටින් මාළු අපනයනය කිරීම සඳහා බහාලුම් වෙත පැටවීම ඉකුත් 29 දා දහවල් එම කර්මාන්ත ශාලා පරිශ්‍රයේ දී සිදු කෙරුණු අතර එම අවස්ථාවට සහභාගිවෙමින් නියෝජ්‍ය අමාත්‍ය රත්න ගමගේ මහතා එසේ සඳහන් කළේය.

මෙරට දෛනික ටින් මාළු පරිභෝජනය ලක්ෂ තුනක් පමණ වන බවත් දිනකට ටින් මාළු ලක්ෂ පහක් නිෂ්පාදනය කිරීමේ ධාරිතාවයක් මෙහි ඇති බවත් ඒ අනුව ටින් මාළු අපනයනයෙන් 2025 වර්ෂයේ දී ඩොලර් මිලියන 8ක් මෙරටට ගෙන ඒමට අපේක්ෂිත බවද එහිදී හෙතෙම පැවසීය.

ඒ අනුව අදාළ ටින් මාළු තොගය එක්සත් අරාබි එමිර් රාජ්‍යය වෙත අපනයනය කෙරෙන අතර මෙම එක් බහාලුමක් කෑන් (ටින්) 48000කින් යුක්ත වේ. ඉන් ඩොලර් 38,000ක් 40,000ත් අතර විදේශ විනිමය මෙරටට හිමිවනු ඇති බව එහිදී අනාවරණය විය.

Ocean food ආයතනය විසින් ධීවරයින් මුහුදින් අල්ලන මාළු ගුණාත්මක මට්ටමින් කර්මාන්ත ශාලාව වෙත රැගෙන ඒමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇති බවද මෙහිදී අනාවරණය විය. මෙහිදී දේශීය ධීවරයින් අල්ලන මාලු කඩිනමින් Ocean food ආයතනයේ යාත්‍රා මඟින් කර්මාන්ත ශාලාව වෙත ගෙන ඒම සිදු කරයි.

එමගින් මාලු පසු අස්වනු හානිය අවම කිරීම හා ගුණාත්මකභාවය පවත්වාගෙන යාම ප්‍රධාන අරමුණු අතර වෙයි. එය අපනයනයට වඩාත් සුදුසු තත්වයේ මාළු කෑනයක් නිෂ්පාදනය කිරීමට බෙහෙවින් උපකාරි වේ. එමෙන්ම මේ මගින් ධීවරයින්ට වැඩි මිලක් මුහුදේ දීම හිමි වන අතර නැවත කඩිනමින් මාළු අස්වැන්න නෙලා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම ද හිමිවෙයි.

මෙරට තුළ ටින් මාළු කර්මාන්ත ශාලා 21 ක් දැනට ක්‍රියාත්මක මට්ටමේ පවතින බවත් ඉන් ධීවර දෙපාර්තමේන්තුවේ පිරිවිතරයන්ට අනුකූලව ලියාපදිංචි කළ දෙවන කර්මාන්ත ශාලාව Ocean food ආයතනය බව මෙහිදි අදහස් දක්වමින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් සුසන්ත කහවත්ත මහතා පැවසීය.

**කරුවලගස්වැව ජයරත්න වික්‍රමාරච්චි**

# හීන්තුඩු කලිත්තා ලෝකයෙන් යන්නම යයි



**යුරෝපයේ** හා උතුරු අප්‍රිකානු රටවලට ආවේනික පක්ෂියකු වන සත්ව විද්‍යාත්මකව Numenium tenuirostris හෙවත් හීන්තුඩු කලිත්තා (Slender-billed Curlew) ලෙස හඳුන්වන පක්ෂී විශේෂය 2024 වසරේ නොවැම්බර් මාසයේ සිට ගෝලීය වශයෙන් වඳවී වී ගොස් ඇතැයි නවතම විද්‍යාත්මක වාර්තාවක් මගින් අනාවරණය කර තිබේ.

බටහිර සයිබීරියාවේ, වගුරු බිම් ආශ්‍රිතව බෝ වී, ශීත ඍතුව මධ්‍යධරණී මුහුද අවට ගතකරන මෙම සංක්‍රමණික පක්ෂී විශේෂය, අවසන් වරට වාර්තා වී ඇත්තේ 1995 වසරේදී පෙබරවාරි මාසයේ මොරොක්කෝවෙන් බව මෙම විද්‍යාත්මක වාර්තාව මගින් අනාවරණය කර ඇත.

Numenium tenuirostris හෙවත් හීන්තුඩු කලිත්තා (Slender-bμlled Curlew) යුරෝපය, උතුරු අප්‍රිකාව හා බටහිර ආසියාවෙ භූමි ප්‍රදේශයන්ගෙන් වාර්තා වන ප්‍රථම ගෝලීය පක්ෂී වඳවී යාම බව ලෝක සංරක්ෂන සංවිධානය (IUCN) පෙන්වා දී තිබේ.

ලෝක සංරක්ෂණ සංවිධානයේ (IUCN) රතු දත්ත ලැයිස්තුවට අනුව තර්ජනයට ලක්ව ඇති පක්ෂි විශේෂ 11000කට වැඩි ගනනකින් පක්ෂි විශේෂ 164ක් මේ වන විට වඳවී ගොස් ඇති බවත් ලෝක සංරක්ෂණ සංවිධානය පවසයි. ඔවුන් තව දුරටත් පවසන්නේ වෙරළාශ්‍රිතව ජීවත්වන තවත් පක්ෂී විශේෂ 16ක් දැඩි තර්ජනයකට ලක්ව ඇති පක්ෂී විශේෂ ලෙස, මේ වනවිට හඳුනාගෙන ඇති බවයි.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වන රතුදත්ත වාර්තාව සකසන ආර්.එස්.පී.බී හා බර්ඩ් ලයිෆ් (R.S.P.B./Bird life )ආයතනයේ ප්‍රධානී නිකොලා ක්‍රොක්ෆොඩ් මහතා පවසන්නේ මෙය ස්වභාවික සංරක්ෂණ සම්බන්ධයෙන් ලෝකය මුහුණ දුන් අතිශය වේදනාත්මක හා අතිමූලික විනාශකාරි කථාවන්ගෙන් එකක් බවයි.

"සාපේක්ෂව ලෝකයේ ධනවත්ම සහ හැකියාවෙන් පූර්ණ යුරෝපයටත් මේ සතුන්ගේ ආරක්ෂාව තහවුරු කරන්න බැරිවුනානම්, යුරෝපයෙන් පිට ලෝකයේ අනෙක් රටවල මේ සතුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අපට දිය හැකි සහතිකය කුමක්ද?" ඒ මහතා ප්‍රශ්ණකර තිබේ.

කාර්මිකරණය හරහා සිදුව ඇති පරිසර දූෂණය, හා ගෝලීය දේශගුණ විපර්යාස මෙම පක්ෂී විශේෂය ලොවෙන් වඳවී යාමට ප්‍රධාන හේතුව බව පරිසර විද්‍යාඥයින්ගේ අදහස වි තිබේ.

**නයනජීව බන්ඩාර**

# දළඳා මාළිගාවේ නිලමේ මේ වන විට වසර 20ක් ධූරයේ



**ඓතිහාසික** ශ්‍රී දළදා මාළිගාවේ වත්මන් නිලමේවරයා මෙ වන විට වසර විස්සක පමණ කාලයක් පුරා සිය ධූරයෙහි රැඳී සිටින බැවින් නිලමේවරයාට පවතින ධුර කාලය වසර පහකට සීමා කළ යුතු බව ඓතිහාසික මිහින්තලා රජමහා විහාරාධිපති පූජ්‍ය ආචාර්ය වලවාහැංගුණවැවේ ධම්මරතන හිමියෝ පවසති.

ඒ හිමියන් මේ බව පැවසුවේ අප්‍රේල් 01 දා මිහින්තලේ පුදබිමේ දී පැවති මාධ්‍ය හමුවකට එක් වෙමිනි. වර්තමානයේ දී මාලිගාවේ නිලමෙවරයා ඉතා දිගු කාලයක් නිලමේ තනතුරේ රැඳී සිටීමට සැලැස්වීමෙන් නිලමේවරයා මුදලාලි කෙනෙකු ලෙස ජනතාව හඳුන්වනු ලබන බවත්, එසේම ඔහු ජනතාවගෙන් චෝදනා ලබන්නෙකු බවට පත්වෙමින් ඇති බවත් එහිමියෝ පවසති.

විහාර දේවාලගම් පනත සංශෝධනය කර අඩුම තරමින් නිලමේවරයාගේ ධූර කාලය වසර 5ක් ලෙස සීමා කරන ලෙසත්, නොමැති නම් උපරිම ධූර කාලය වසර 10කට සීමා වන සේ ගැසට් පත්‍රයක් ඉදිරිපත් කරන ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටින බවත් උන්වහන්සේ පවසති. මේ පිළිබඳ අනාවරණය කිරීම නිලමේවරයා සම්බන්ධයෙන් පෞද්ගලිකව ගැටලුවක් නොවන බවත්, පූජනීය වස්තු රැක ගැනීමට හානියක් නොවිය යුතු බවත් උන්වහන්සේ මෙහිදී පැවසූහ.

**තිරප්පනේ සමන් කේ.ගමගේ**

# ලංකාවේ ඒඩ්ස් රෝගීන් ඉහළට



**ශ්‍රී** ලංකාව තුළ HIV ව්‍යාප්තිය ඉහළ යමින් පවතින හෙයින් කඩිනමින් පරීක්ෂණ වෙත යොමු වන ලෙස ජාතික ලිංගාශ්‍රිත රෝග හා ඒඩ්ස් මර්දන වැඩසටහන ජනතාවගෙන් ඉල්ලා සිටී.

එම වැඩසටහන අවධාරණය කරන්නේ මෙරට තුළ නව HIV සමඟ ජීවත්වන පුද්ගලයන්ගේ කැපීපෙනෙන වර්ධනයක් මෑත කාලයෙහි දක්නට ලැබී ඇති බවයි.

ඒ අනුව 2024 වසර තුළ පමණක් නව HIV සමග ජීවත්වන පුද්ගලයන් 824 ක ප්‍රමාණයක් වාර්තා වී ඇති අතර එම පුද්ගලයන් ගෙන් 718ක් පිරිමි පුද්ගලයෝ වෙති.

එසේම වයස අවුරුදු 15-24 ත් අතර වයස් කාණ්ඩයේ නව HIV සමඟ ජීවත්වන පුද්ගලයන්ගේ කැපී පෙනෙන වර්ධනයක් මෑත කාලයෙහි දක්නට ලැබී ඇත. ඒ අනුව 2024 වසරෙහි පමණක් අවුරුදු 15-24 ත් වයස් කාණ්ඩයේ නව HIV සමග ජීවත්වන පුද්ගලයන් 115ක් හඳුනාගෙන තිබේ.

එසේම2024 වර්ෂයේ දී වාර්තා වී ඇති ඒඩ්ස් මරණ ගණන 47 කි. 2023 වර්ෂය හා සැලකීමේදී එම AIDS මරණ 20% කින් පහළ ගොස් ඇත. මේ පිළිබඳ වැඩිදුර තොරතුරු www.aidscontrol.gov.lk වෙබ් අඩවියෙන් ලබා ගැනීමේ හැකියාව පවතී.